අභ්‍යන්තර විභාග නිවේදනයයි

මගේ අංකය: **PPSC/EX/4/1/3/2024**
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2024.01.26

පළාත් පාලන කොමසාරිස් - වයඹ.

**<u>වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය- 2024(I)</u>**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් **2024 පෙබරවාරි** මාසය තුළ කුරුණෑගලදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ අනුව ආදායම් පරීක්ෂක III ශ්‍රේණියේ නිලධාරීන්ට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම් කළ හැක.

02. මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කරගත යුතු අතර, නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2024.02.19** දින හෝ එදිනට පෙර **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බී දොරටුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

03. **අයදුම්පත්‍රය:-** A- 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතයට ගනිමින් පිළියෙල කරගත් අයදුම්පත්‍රය නිවැරදිව හා පැහැදිලිව අයැදුම්කරුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය.

04. **විභාග ගාස්තු:-** පළමුවරට මෙම විභාගයට අයදුම්කිරීමට කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. .එසේ වුවත් ඉන් පසු වාර වලදී නිලධාරීන් විසින් එක් විෂයක් සඳහා අයදුම් කරන්නේ නම් රු 300/= ක්ද, විෂයන් 02 ක් සඳහා අයදුම් කරන්නේ නම් රු 600/= ක්ද, විභාග ගාස්තු වශයෙන් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරණ ආදායම් ශීර්ෂයට බැර වන පරිදි තම ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෝ සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ව.ප.ස.මු.02 ආකෘතියෙන් ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

05. **අනන්‍යතාව :-** විභාග අපේක්ෂකයින් විභාග ශාලාවතුලදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කවරක් වුවද පිළිගත හැකිය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රයක් )
III. වලංගු රියදුරු බලපත්‍රය

06. **<u>විභාග ප්‍රවේශපත්‍ර</u>** :- විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා, **ඔවුන් තම අයඳුම්පත්‍රයේ සඳහන් කර ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail address) විභාග ප්‍රවේශපත්‍රය යොමු කරනු ලැබේ. අයඳුම්කරුවන් විසින් තම විභාග ප්‍රවේශපත්‍රය භාගත කර ගත යුතු අතර, එලෙස විභාග ප්‍රවේශපත්‍රය භාගත කර ගත නොහැකි අයඳුම්කරුවන් වෙතොත් විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයෙන් විමසිය යුතුය.** එලෙස අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර යොමු කළ වහාම ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන්

සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) පළකරන අතර, ඒ බව අදාළ දෙපාර්තමේන්තු වෙතද ලිඛිතව දැනුම් දෙනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාළ අයදුම්කරුවන් ඒ පිළිබඳව දැනුවත් කළ යුතුය.

**සැළකිය යුතුයි -:**

**අයදුම්කරු විසින් තම අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන විද්‍යුත් තැපැල් ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍රය යොමු කරන බැවින් එය නිවැරදිව අයදුම්පත්‍රයේ සඳහන් කිරීම අනිවාර්යය වේ.**

07. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. විභාගය සඳහා ප්‍රවේශපත්‍ර ලැබූ, පළමු වතාවට විභාගයට අයදුම්කරඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතු අතර, ගමන් ගාස්තු නොගෙවිය යුතුය.

08. අපේක්ෂකයින් අදාල සේවයට ඇතුලත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් පිළිතුරු සැපයිය යුතුය.

09.විභාග පටිපාටිය :-

මෙම පරීක්ෂණය පහත සඳහන් විෂයන් සම්බන්ධයෙන් සැකසෙන ලිඛිත ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ. එක් එක් පරීක්ෂණය සඳහා උපරිම ලකුණු 100 කි. සමත් වීම සඳහා එක් එක් පරීක්ෂණයෙන් ලකුණු 40% හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

| | විෂයය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01. | ආයතන රෙගුලාසි හා කාර්ය පටිපාටික රීති. | පැය 01 යි | 100 | 40% |
| 02. | පළාත් පාලන ආයතනවල මූල්‍ය නීති රීති. | පැය 01 යි | 100 | 40% |

<u>**විෂය නිර්දේශය:-**</u>

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන රෙගුලාසි හා කාර්ය පරිපාටික රීති. | I ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ VII, VIII, XII, XIV, XVII, XXIV, XXVIII, XXXI පරිච්ඡේද<br>II වයඹ පළාත් සභාවේ කාර්ය පටිපාටික රීති |
| පළාත් පාලන ආයතනවල මූල්‍ය නීති රීති. | I පළාත් පාලන අයවැය ලේඛනය / වරිපනම් ලේඛනය හා එහි කටයුතු<br>II දේපළ තක්සේරු කිරීම / ඉඩම් හා ගොඩනැගිලි ලේඛන<br>III කර්මාන්ත බදු වෙළඳ බලපත්‍ර ගාස්තු ඉඩම් විකිණීම් බදු<br>IV මාසික ආදායම් හා හිඟ ආදායම් / නිලධාරීන්ගේ ඇප |

මීට අමතරව සංවර්ධන ආඥා පනත, පරිසර පනත, සෞඛ්‍ය පනත, ප්‍රාදේශීය සභා, නගර සභා ආඥා පනත් හා ප්‍රාදේශීය සභා රීති සංග්‍රහය පිළිබඳ දැනුමද අපේක්ෂා කෙරේ.

10. මෙම විභාග නිවේදනයේ විධි විධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගෙන් විමසීමෙන් අනතුරුව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඊ.එම්.පී.ඒකනායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය- 2024 (I)**

01. 1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්):- ............................................................................
..........................................................................................................මයා/මිය/මෙනවිය

1.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්)Mr./Mrs./Miss.............................................................
.............................................................................................................................

1.3 මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්): .................................................................
.............................................................................................................................

1.4 විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) :- ................................................................................
……………………………………………………………………………………...

**(විද්‍යුත් තැපැල් ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍රය යොමු කරන බැවින් එය නිවැරදිව සඳහන් කිරීම අනිවාර්යය වේ.)**

1.5 ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.6 උපන් දිනය:-අවුරුද්ද

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

02. සේවා ස්ථානය හා ලිපිනය

2.1 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම:- ..............................................
.............................................................................................................................

2.2 රාජකාරි ලිපිනය:- ........................................................................................................
.............................................................................................................................

2.3 දුරකතන අංකය :- රාජකාරී : ..............................................
පෞද්ගලික : ..............................................

03. දැනට දරණ තනතුර:-

3.1 තනතුර :.........................................................
3.2 පන්තිය : ........................................................
3.3 ඉහත පන්තියට පත්වූ දිනය :....................................

04. ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය:-

| |
|---|
| |

(සිංහල - S , දෙමළ - T , ඉංග්‍රීසි - E )
(අදාල අක්ෂරය කොටුව තුල ලියන්න)

05. ඔබ විභාගයට ඉල්ලුම්කරන විෂයයන්:- (ප්‍රශ්න පත්‍රයේ නම සඳහන් කරන්න.)

I. .........................................................................
II. .........................................................................

06. ඔබ විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවටද ? ..........................................
6.1 එසේ නොවන්නේ නම් විභාග ගාස්තු ගෙවා ලබාගත් (අලවා ඇති) කුවිතාන්සියේ,
කුවිතාන්සි අංකය:- ........................................... මුදල:- .....................................
දිනය:- .......................................................
නිකුත් කල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය:- ..................................................

| කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |
| --- |

07\. අයැදුම්කරුගේ සහතිකය:-

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත 4 ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිපැදීමටද එකඟ වන අතර, මා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු / නිලධාරිනියක බවද සහතික කරමි.

.........................................................
අයැදුම්කරුගේ අත්සන

දිනය:- ....................................

08\. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

I. ඉහත විස්තර සඳහන් ……………………......………………….............……. නැමැති මෙම නිලධාරියා/නිලධාරිනිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු/ නිලධාරිනියක බවද,
II. ඔහු/ඇය ආදායම් පරීක්ෂක.............................. ශ්‍රේණියේ නිලධාරියෙකු/ නිලධාරිනියක බවද,
III. ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවද,
IV. මෙම විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට බවද/ පළමු වතාවට නොවන බවද, නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඇති බවද,
V. අයැදුම්කර ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම ඇති බවද, සහතික කරමි.
(අදාල නොවන වචන කපා හරින්න)

………………....……………………
ආයතන /පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

පදවි නාමය :…………………………………………………….
ලිපිනය :…………………………………………………....
දිනය :…………………………………………………….